# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1880/23 – 2014 සැප්තැම්බර් 18 වැනි බ්‍රහස්පතින්දා – 2014.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩමේ පරවශතාව, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි. එකී පරවශතාව අත්කර ගනු ලබන්නේ කවර ඉඩමකින්ද යන්න 2 ඡේදයේ විස්තර වේ.

**පරවශතාවේ විස්තරය.**–කොළොන්න බලංගොඩ ජල සම්පාදන ව්‍යාපෘතියේ, පනාමුරේ භූගත ජලාශයට ප්‍රවේශ මාර්ගය ඉදි කිරීම සඳහා අතිරේක ඉඩම් කොටසක පරවශතාවය අත්කර ගැනීම.

**ඉඩමේ විස්තරය.** – සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දියපොටගම් පත්තුව සුළු කොට්ඨාසයේ, පනාමුර ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක R/EMB/2013/558 හා 2013.12.11 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' ලෙස සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.1205ක් පමණ වන 'කෝන්ගහහේන' නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කෝන්ගහහේන – ප්‍රමාණය: හෙක්. 0.1205ක් පමණ**

උතුරට: මාර්ගය (මා.සං.අ.) සහ කේ. ඒ. හීන්හාමි හිමිකම් කියන කෝන්ගහහේන; නැගෙනහිරට සහ දකුණට: කේ. ඒ. හීන්හාමි හිමිකම් කියන කෝන්ගහහේන; බටහිරට: කේ. ඒ. හීන්හාමි හිමිකම් කියන කෝන්ගහහේන සහ මාර්ගය (මා.සං.අ.).

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය .

යොමු අංකය: 4/3/9/2013/WS/05.
2014 අගෝස්තු මස 01 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

10 – 240

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

1A – G20275 – 25 (2014/09)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟබඩ පත්තුව උතුර සුළු කොට්ඨාසයේ, කඹුරුපිටිය ගමේ සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/කේඑම්බී/2013/735 හා 2014.01.10 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 4.0173 ක් පමණ වන රටලංකාවත්ත නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – රටලංකාවත්ත – ප්‍රමාණය: හෙක්. 4.0173**

උතුරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන රටලංකාවත්ත මාර්ගය, රජය හිමිකම් කියන රටලංකාවත්ත, මතුරට වැවිලි සමාගම හිමිකම් කියන රටලංකාවත්ත කුඹුර, මතුරට වැවිලි සමාගම හිමිකම් කියන රටලංකාවත්ත සහ ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය හිමිකම් කියන රටලංකාවත්ත; නැගෙනහිරට: මතුරට වැවිලි සමාගම හිමිකම් කියන රටලංකාවත්ත කුඹුර, මතුරට වැවිලි සමාගම හිමිකම් කියන රටලංකාවත්ත, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය හිමිකම් කියන රටලංකාවත්ත සහ ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය හිමිකම් කියන රටලංකාවත්ත මාර්ගය; දකුණට: මාර්ගය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන රටලංකාවත්ත; බටහිරට: මාර්ගය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන රටලංකාවත්ත, රජය හිමිකම් කියන රටලංකාවත්ත, මතුරට වැවිලි සමාගම හිමිකම් කියන රටලංකාවත්ත කුඹුර, මතුරට වැවිලි සමාගම හිමිකම් කියන රටලංකාවත්ත සහ ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය හිමිකම් කියන රටලංකාවත්ත.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය .

යොමු අංකය: 4/3/4/2013/ඩී/493.
ප්‍රදේශීය ලේකම්ගේ යොමු අංකය: KMB/LAN/ACQUI/02/62.
2014 ජූලි මස 21 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'ගොවිජන මන්දිරය',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

10 – 241

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.